# ගෙවතු වගාව මඟින් වැහි වතුර ප්‍රශස්ථව භාවිතා කිරීම

ගෙවතු වගාවට 'අපි වවමු-රට නගමු' වැඩසටහන තුළ ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇති අතර එය රටේ ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛ දායකත්වයක් සපයන බව අපි දනිමු. මෙය වඩාත් පැහැදිලි වන්නේ අප පවුල් වශයෙන් අපගේ ආහාර අවශ්‍යතාවයෙන් හැකි උපරිම ප්‍රමාණයක් නිපදවා ගැනීමට කටයුතු කළහොත් එය අපේ පවුලේ ආර්ථික ශක්තිය වැඩි කර ගැනීමට ඉවහල් වන නිසාවෙනි. එමෙන්ම, රසායනික පොහොර හෝ කෘෂි රසායන නොයෙදූ බවට විශ්වාසයක් ඇතිව ආහාරයට ගැනීමට හැකි වීමෙන් නිරෝගී දිවියක් ගෙවීමට වාසනාව උදා වේ. එමඟින් ප්‍රතිකාර ගැනීමට පවුලට වැය වන වියදම ඉතිරිවන අතරම රටට ආනයනය කරන ඖෂධවලට වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමට ද හැකියාව ලැබේ. මේ සියල්ලට අතිරේකව නිසි ආකාරයට ගෙවතු වගාව සඳහා ගෙවත්තට වැටෙන වැසි ජලයෙන් උපරිම ප්‍රමාණයක් වගාවන් සඳහා භාවිතා කිරීමට භූගත හෝ භූගත ජලය ලෙස රඳවා ගැනීම සිදු කළ හැකි වේ. එමඟින් වගාවේ ජල අවශ්‍යතා සඳහා වියදමක් දැරීමට සිදු නොවනු ඇත. තව ද, එය ගංවතුරට මෙන්ම නියඟයට පිළියමක් වේ.

දනට, ශ්‍රී ලංකාවේ සුලභම හා වැඩිම හානි ඇති කරන උවදුර වන්නේ ගංවතුර හා නියඟය යි. මෙම ආපද තත්ත්වය ඇති වන හේතුවත්, මෙයට යම් පිළියමක් යෙදිය හැකි ආකාරයත් පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි. අප වෙත එන සෑම අයහපතක් ම යහපත් ආකාරයෙන් යොදා ගැනීමට පියවර ගැනීම රටේ මෙන් ම අපේත් සාර්ථකත්වයට හේතු වනු නො අනුමාන ය.

වසර 1994 සිට 2003 දක්වා ශ්‍රී ලංකාවේ සිදු වී ඇති උවදුරු ප්‍රමාණය හා ප්‍රතිශතය මෙහි ඇති වගුවෙන් දක් වේ. ඒ අනුව ගංවතුර, නාය යෑම්, සමුද්‍ර බාදනය, සුළිසුළං නියඟය යන උවදුරු අතරින් වැඩිම ආපදවක් සිදු වී ඇත්තේ ගංවතුර නිසා බව පෙනී යයි. රූපය-1 අනුව, උපරිම මරණ ප්‍රතිශතයක් නාය යෑම් නිසා (65%) සිදුව ඇති බව පෙනී යන අතර දෙවැනි තැන හිමිව ඇත්තේ (22.5%) ගංවතුරටයි. හානි වී ඇති නිවාස සංඛ්‍යාව සැලකූ විට මුල් තැන ගංවතුරටත් (53.85%), දෙවැනි තැන සුළි සුළංවලටත් (39.84) හිමිව ඇති බව පෙනී යයි. ආපද බලපෑ පවුල්

වගුව 1

**1994 සිට 2003 දක්වා ශ්‍රී ලංකාවේ සිදුව ඇති උවදුරු ප්‍රමාණයන්**

| | ගංවතුර | නාය | සමුද්‍ර යෑම | සුළි බාදනය | නියඟය සුළං | එකතුව |
|---|---|---|---|---|---|---|
| මරණ සංඛ්‍යාව | 76 | 221 | 1 | 45 | 0 | 340 |
| හානි වූ නිවාස සංඛ්‍යාව | 123,844 | 3,773 | 10,223 | 91,616 | 0 | 229,959 |
| බලපෑ පවුල් සංඛ්‍යාව | 875,883 | 5,236 | 12,104 | 438,869 | 881,239 | 2,213,314 |
| ආපද සහන වියදම (රු.ලක්ෂ) | 19,866 | 70 | 31 | 612 | 8,522 | 34,583 |

රූපය - 1

**1994 සිට 2003 දක්වා ශ්‍රී ලංකාවේ සිදුව ඇති උවදුරු ප්‍රමාණයේ ප්‍රතිශතයන්**



සංඛ්‍යාව සැලකූ විට මුල් තැන නියඟයටත් (39.82%) දෙවැනි තැන ගංවතුරටත් හිමි ව ඇති බව පැහැදිලි ය. ආපද සහන වියදම සැලකූ විට, මුල් තැන ගංවතුරත් (57.44%), දෙවැනි තැන නියඟයටත් (24.64) හිමි ව ඇති බව පෙනී යයි. එබැවින්, සමස්ත ආපදවලින් ඉතාමත් ප්‍රමුඛ ස්ථානයක් ගංවතුරටත් හිමිවන බව පැහැදිලි ය.

කලින් රත්නපුර, කළුතර ආදී ප්‍රදේශවල බහුලව පැවති ගංවතුර දැන් බහුලව කොළඹ හා ගම්පහ ආශ්‍රිත ප්‍රදේශවලට ද බලපායි. මෙම තත්ත්වය උද වී ඇත්තේ පහත් හා වගුරු බිම් ගොඩ කිරීම, ජලාශ ප්‍රමාණය සංඛ්‍යාත්මකව මෙන් ම ධාරිතාවයෙන් අඩුවීම වැනි හේතු නිසා ය. වියළි කලාපීය දිස්ත්‍රික්කවල ද කෙටි කාලයක් තුළ අධික වර්ෂාපතනයක් ලැබීමෙන් මෙන් ම ජලාශවල ඉවුරු බිඳී යාම නිසා ගංවතුර ඇති වී තිබේ. පැරණි මුතුන් මිත්තන් මෙවැනි ගංවතුර තත්ත්වයන් පාලනය කිරීම ද අරමුණු කරගෙන වැව් ඉදි කළ බව සැලකිය හැකිය. මෙය මුලින් සඳහන් කළ එම 'සෑම අයහපතක් ම යහපත් ආකාරයෙන් යොද ගැනීම' යම් ප්‍රමාණයකට සනාථ කරන්නකි. අතීත රජවරුන් එකවර කාර්යයන් ගණනාවක් කිරීමට දක්ෂ හැකියාවන්ගෙන් යුක්ත විය. වැව් තැනීමේ දී ඉවත් වන පස් සුදුසු අයුරින් වෙහෙර-විහාර කරවීමට යොද ගන්නා ලදී. වැවේ එක්වන ජලය විශේෂයෙන් වියළි කාලයේ පානය කිරීම, වගා කටයුතුවලට මෙන්ම පරිසරයේ සතුන් හා ශාක පැවැත්මට යොද ගැනීමට අවස්ථාව සලසන ලදී.

පසුගිය වසරේ (2008) නොවැම්බර් මස ඇති වූ ගංවතුර තත්ත්වය ගම්පහ, ගාල්ල, මාතර, කළුතර, කොළඹ දිස්ත්‍රික්කවලට දැඩිව බලපෑ අතර පවුල් පන්දහසක් පමණ විපතට පත් වූ බව සඳහන් විය. අන්තර් මෝසම් වැසි සමයේ දී, බොහෝ විට සිදුවන ආකාරයට මෙවර ද නිල්වලා, ගිං ගඟ, අත්තනගලු ඔය, කුකුලේ ගඟ උතුරා පහත් බිම් රැසක් යට වී ප්‍රබල ගංවතුර හානියක් සිදු විය.

අත්තනගලු ඔයේ ජලය පිටාර ගැලීම හේතුවෙන් ගම්පහ නගරය හා ඒ ආශ්‍රිත හිරි පිටිය, ජා ඇල, ගනේමුල්ල, නිට්ටඹුව, දිවුල්ලෑව, මල්වාන, පූගොඩ, දෙකටන ආදී ප්‍රදේශවල පහත් බිම් මාර්ග හා නිවාස රැසක් ජලයෙන් යට විය. කළුතර දිස්ත්‍රික්කයට ද සුපුරුදු පරිදි වැස්සෙන් හානි රැසක් සිදු විය. මේ අතර ආපද සහන සේවා අමාත්‍යාංශය පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ වාර්තා කරන ලද්දේ කළුතර, ගම්පහ, මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල පවුල් 20,673 කට අයත් පුද්ගලයන් 86,550 ක් අවතැන් වූ බවයි.

නිවාස සියයක් පමණ හානියට පත්ව ඇති අතර මුළුමනින්ම විනාශ වූ නිවාස 18 ක් අතරින් 17ක් මාතර දිස්ත්‍රික්කයේ බව වාර්තා වී තිබේ. සහන සේවා හා පිසූ භාර බෙද දීම වෙනුවෙන් ඔක්තෝබර් 24 වෙනිද වන විට එම අමාත්‍යාංශය මඟින් රුපියල් ලක්ෂ 70ක මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබුණි. පූර්ව අවබෝධයක් ඇතිව පැමිණි ගංවතුරකින් මෙවන් හානි සිදුවූයේ නම් එසේ නොවූන විට හානිය මීට වඩා වැඩි වන බව පැහැදිලි ය. එබැවින්, වඩාත් උනන්දුවෙන් මෙයට පිලියම් ගැන උනන්දු විය යුතුව තිබේ. විවිධ ආර්ථික දුෂ්කරතා අතරින් සංවර්ධනය වෙත යාමට ප්‍රයත්න දරන ශ්‍රී ලංකාවට එය ඉතාම වැදගත් වේ. මෙලෙස විශාල පිරිසක් විවිධ අපහසුතාවන් ට පත්වන්නේ යම් තාක් දුරට මෙම ගංවතුර තත්ත්වයන් පාලනය කිරීම හා හානි අවම කිරීමට අවස්ථාව පැවතිය දීය. එලෙස කටයුතු කලහොත් මෙම හානි අවම කිරීම, සහනාධාර ලෙස වැයවන මුදල් අවමවීම හා සහන කටයුතු සඳහා වැයවන ශ්‍රමය මෙන් ම ආපද වූවන්ගේ ශ්‍රමය අහිමිවීම අවම වීම යන හේතු මත රටේ ආර්ථික සංවර්ධනයට හිතකර බලපෑම් ඇති වේ.

## සාමාන්‍ය මාසික වර්ෂාපතනයන් හා ගංවතුර ඇතිවීමේ ස්වභාවය

ස්ථාන කිහිපයක (1961-1990 කාලය තුළ) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයන් (මි.මී.වලින්) අංක 2 රූපසටහන මඟින් දක්වා ඇත. ඒ අනුව ත්‍රිකුණාමලය 1500, මාලිම්බොඩ 5330, බදුල්ල 1762, මඩකලපුව 1651, ගාල්ල 2378, කොළඹ 2424, හම්බන්තොට 1049.6, යාපනය 1231, මන්නාරම 963 හා රත්නපුර 3766 ලෙස පෙන්නුම් කෙරේ. ඒ අනුව, කොළඹ මධ්‍යනය මාසික උපරිම වර්ෂාපතනය මැයි, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල පවතී. එය මි.මී. 393 ට අඩු අගයකි. ඔක්තෝබර් මාසයේ දී රත්නපුර හා මාලිම්බොඩ වැනි ස්ථානවල මි.මී.438 හා 682 වැනි ඉහළ

සාමාන්‍ය මාසික වර්ෂාපතනයන් ඇති අතර දිනක, දෙක, තුනක වර්ෂාපතනය ඉහළ අගයක පැවතීම, පහළ ප්‍රදේශවලට ගංවතුර තත්ත්වයන් ඇතිවීමට හේතු වේ. සැප්තැම්බර් මාසයේ දී මන්නාරම හා හම්බන්තොට ප්‍රදේශයට ලැබෙන්නේ සාපේක්ෂව අඩු වර්ෂාපතනයකි. එබැවින්, අතිරේක ජලය එම ප්‍රදේශවලට යොමු කිරීමට සැලසුම් කිරීම ඵලදායී වේ. කෙසේ වෙතත්, සුදුසු ලෙස වැඩි ජලය ගබඩා කර පසුව ක්‍රමානුකූලව මුදා හැරෙන ක්‍රමයක් සැකසීමෙන් ගංවතුර ආපදා අවම කර ගත හැකි වේ.

ගංවතුර ඇති වෙයි. එබැවින්, ගංවතුර අඩු කිරීම ද ගෙවතු මට්ටම, ඇළ, දොළ, ගංගා මට්ටම යන ස්ථර හතරකින් සිදු කළ හැකිය.

### ගංවතුර හානි අවම කිරීම

ගංවතුර හානි අවම කිරීමට බොහෝ දුරට පරිසරයට සිදුවන හානිය අවම වන ලෙස කටයුතු කළ යුතුය. මේ සඳහා භූමිය මත වැටෙන වැසි වතුර ප්‍රමාණයෙන් උපරිමයක් භූමිය තුළ පාංශු ගබඩාවේ හෝ මතුපිට රඳවා ගැනීමට කටයුතු

රූපය - 2

**ස්ථාන කිහිපයක සාමාන්‍ය මාසික වර්ෂාපතන : (1961-1990 කාලය තුළ - මි.මී)**




*මූලාශ්‍රය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, 1961-1990*

### ගංවතුර ඇතිවීම

විශාල ජලාශවල වේලි පුපුරා යාම ආදී කරුණු හේතුවෙන් ද ගංවතුර තත්ත්වයන් ඇති විය හැකි අතර බහුලව ඇතිවන්නේ අධික වර්ෂාව නිසා ඇතිවන ගංවතුර තත්ත්වයන් ය. මුලින් සඳහන් කළ ස්වරූපයේ ගංවතුර අපට නොසලකා හැරිය නොහැක්කේ රටේ ස්වභාවික ආපදාවන් හැරුණු කොට ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ද විශාල ජලාශවල වේලි පුපුරායාම් සිදු විය හැකි නිසාවෙනි.

කෙටි කාලයක් තුළ විශාල වර්ෂාපතනයක් ලැබීමත්, එම ජලය ප්‍රමාණවත් මට්ටමින් ගබඩා නොවීම හා ගලා නොයෑම නිසා බහුලව ගංවතුර ඇතිවන බව පැහැදිලි ය. පහත දැක්වෙන ආකාරයට වැස්ස සමඟ ඇතිවන දිය බිඳු, ඇළ, දොළ, ගංගා ඔස්සේ ක්‍රමවත්ව ගලා නොයන විට

කළ යුතුය. පස තුළට ජලය ඇතුළුවීමට සුදුසු වන පරිදි වන ආවරණය වැඩි කිරීම හා කාබනික ද්‍රව්‍ය පාංශු ආවරණ ලෙස යෙදීම හෝ පැවතීමට ඉඩදීම සිදු කළ යුතු වේ. කැලෑ එළි කිරීම හා මාර්ගවල තාර හා කොන්ක්‍රීට් ඇතිරීම ආදියෙන් පසට උරා ගන්නා ජලය අවම වී ඉක්මණින් මතුපිට ජලය ලෙස ඇළ, දොළ, ගංගා වෙත ගලා යාමෙන් ගංවතුර තත්ත්වයන් ඇති වේ.

මෙහි දී, අප සැවොම මේ සඳහා තම හැකියාව අනුව උපරිම දායකත්වයක් ලබාදිය යුතුය. මෙයට අදාළ වන සැලසුම් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ලෙස වර්ග කරමු. පහතින් දක්වා ඇත්තේ ගංවතුර අඩු කිරීමට ගෙවතු මට්ටමේ දී දායක විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු ය. (වගු අංක 2 බලන්න) මෙහි දී සැලකිය යුත්තේ යම් ආකාර අන්‍යෝන්‍ය

වගුව - 2

## ගෙවතු මට්ටමින් ගංවතුර හානි අවම කිරීම

| | සිදු කළ හැකි කාර්යයන් | අවධාරණයන් |
|---|---|---|
| කෙටි කාලීන | වන ආවරණය වැඩි කිරීම<br>වගාවන් කිරීමේ දී වසුන් යෙදීම<br>කොම්පෝස්ට් පොහොර යෙදීම<br>සමෝච්ඡ රේඛා ඔස්සේ වගා කිරීම<br>ගැටළු ඇති තැන් හඳුනා ගැනීම<br>පොල් වැනි ගස් වටා කාණු කැපීම හා පොල් ලෙලි වැළලීමෙන් වැඩි ජල ප්‍රමාණයක් රැඳීමට අවකාශ සැලසීම | ප්‍රදේශයට උචිත තුරු වියන් ගණනාවක් ඇති වගාවන්<br>දිරා ගිය ශාක කොටස්, පිදුරු හා අතු වර්ග යෙදීමෙන් ජලය අවශෝෂණය වී පෝෂණ ගුණ රැකේ.<br>එක්වර ජලය බෑවුම් ඔස්සේ පහළට ගලායාම අඩු කරන අතර එමගින් පස තුළට ජලය ගමන් කිරීම වැඩි කරයි.<br>ගසේ මූල මණ්ඩලයට හානියක් නොවන ලෙස සුදුසු අයුරින් කාණු කැපීම හා ලෙලි වැළලීම සිදු කරයි. |
| මධ්‍ය කාලීන | සෝල්ට්(දෙවැටි වගා) යෙදීම<br>සමෝච්ඡ රේඛා ඔස්සේ කුට්ටි කාණු කැපීම<br>සමෝච්ඡ රේඛා ඔස්සේ ගල් බැමි සැකසීම | උචිත ශාක යොදා ගෙන දෙවැටි වගා සිදු කිරීමෙන් හා කුට්ටි කාණු මගින් පාංශු ඛාදනය අඩුවීමට අමතරව පස තුළට ජලය ගමන් කිරීම වැඩි කරයි. |
| දිගු කාලීන | ගලා යන අතිරේක වැසි ජලය රැස් කිරීමට කුඩා ටැංකි හෝ පොකුණු සැකසීම. | බෑවුම් ඔස්සේ පහළට ගලා යන ජලය රඳවා ගනී. ප්‍රදේශයේ උපරිම වර්ෂාපතනය හා බිමේ වර්ගඵලය සලකා ටැංකි හෝ අමුණු එනත් හෝ කිහිපයක් සකස් කළ හැකිය. |

සහයෝගයකින් කටයුතු කිරීමේ අවශ්‍යතාවයයි. එමගින් පොදුවේ රටටම සිදුවන ගංවතුර ආපදාව අවම කර ගත හැකි වේ.

ගංවතුර හානි අවම කිරීම සඳහා ගෙවතු මට්ටම කෙටි කාලීන සැලසුම් සකසා ක්‍රියාත්මක කිරීම නිවැසියන් විසින් ද, මධ්‍ය කාලීන සැලසුම් සකසා ක්‍රියාත්මක කිරීමේ දී ආසන්න පිරිස් හා අදාළ නිලධාරීන් ගේ ද දයකත්වය සහිත ව නිවැසියන් විසින් ද, දිගු කාලීන සැලසුම් සකසා ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍යතාව අනුව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල මහ පෙන්වීම ලබා නිවැසියන් විසින් ක්‍රියාත්මක කිරීම ද උචිත වේ.

### ගෙවතු මට්ටමේ අවධාරණයන්

තම නිවාස හා ඉඩම මත වැටෙන වැසි වතුර ප්‍රමාණය රැක ගැනීමට කටයුතු කළහොත් මෙම ගංවතුර ප්‍රශ්නය බොහෝ දුරට අඩු කර ගැනීමට හැකි වේ. කෙසේ වෙතත්, මෙය එතරම් පහසු කටයුත්තක් නොවන බව පැහැදිලි ය. එබැවින්, පියවරින් පියවර එම කාර්යය සඳහා කටයුතු කිරීමට සැලසුම් කළ යුතු වේ. වැසි ජලය රැක ගැනීම මගින් පසුව භාවිතා කිරීමටත්, සමහර අවස්ථාවල මිරිදිය මත්ස්‍ය වගාව හා කොහිල, නෙලුම් ආදී වගාවන් සිදු කිරීම මගින් අතිරේක ආදයමක් ලබා ගැනීමටත් හැකියාව ලැබේ.

එහි දී, තම නිවස හා ඉඩම මත වැටෙන වැසි වතුර ප්‍රමාණයෙන් උපරිමයක් (80%) තම ඉඩමේ මතුපිට හෝ පාංශු ගබඩාවේ රඳවා ගැනීමට කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය. මෙහි දී, පස තුළට ජලය යෑමට සුදුසු වන පරිදි පස බුරුල්ව තැබීම හා කාබනික ද්‍රව්‍ය මතුපිටින් යෙදීම සිදු කළ හැකි වේ. මේවා මගින් උරා ගන්නා ජලය පසුව සෙමෙන් ඇළ, දෙළ, ගංගා ඔස්සේ මුහුද වෙත ගලා යාමෙන් ගංවතුර ඇතිවීම අවම වේ. දනට සිදුවන්නේ වැසි ජලය උරා ගැනීම අවම වී උපරිම ප්‍රමාණයක් කෙටි කාලයක් තුළ ගංගා වෙත පැමිණීමෙන් ගංවතුර ඇතිවීමයි.

කොළඹ වර්ග මී. 100ක ගෙවත්තක් හිමිකරුවකුට දින දෙක, තුනක් තුළ මි.මී. 200ක

වර්ෂාපතනයක් ලැබුණහොත් එය ඝන මී. 20ක වැසි ජල ප්‍රමාණයක් වේ. මෙම ප්‍රමාණයෙන් 50%ක් භූගතව රැස්වීමට ඉඩ ලබා දුනහොත් ගලා යන්නේ ඝන මී. 10ක වැසි ජල ප්‍රමාණයකි. එබැවින්, ඝන මී. 10ක පමණ ධාරිතාව ඇති ජල පොකුණක් හෝ කිහිපයක් හැකියාව අනුව සකසා ගැනීම ප්‍රමාණවත් ය. මෙලෙස ගොඩ ඉඩම් මත පතිත වන වැසි ජලය ඇලවල් වෙත පැමිණීම අවම කිරීමෙන් ගංවතුර බලපෑම අඩු කර ගත හැකි වේ.

කුඩා ටැංකි හෝ පොකුණු සැකසීමේ දී කොන්ක්‍රීට් හෝ සිමෙන්ති යෙදීම අත්‍යාවශ්‍ය නොවන අතර දේශීයව ඇති ද්‍රව්‍ය යොද අඩු වියදමකින් හා පවතින ශ්‍රමය යොද සැකසීම ප්‍රමාණවත් වේ. ඒවා ඉදිකිරීමට සුදුසු ස්ථාන වැසි ජලය ගලා යන ආකාරය හා ඉන් ගන්නා ප්‍රයෝජනය අනුව තීරණය කළ හැකිය. පසෙහි තැනූ පතුලට කොන්ක්‍රීට් හෝ බදම නොයෙදූ කුඩා ටැංකි හෝ පොකුණු වල පතුලින් පසට එක්වන ජලය සෙමෙන් පහළ ඇළ දෙළ කරා ක්‍රමයෙන් එක් වේ. එය ගංවතුරට බලනොපාන්නේ මෙම ප්‍රමාදය නිසාවෙනි. මෙහි දී, නිවෙස් වහල මත වැටෙන වැසි ජලය පානය සඳහා රැස් කිරීමට අදහස් කරයි නම් එය වැසි ජල සංසදය වැනි ආයතනයක උපදෙස් අනුව ෆෙරෝසිමින්ති වැනි ද්‍රව්‍යවලින් සැකසිය හැකිය. එමගින් ද, ජලය වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීමට අවස්ථාව සැලසේ

මෙලෙස ගංවතුරින් සිදුවන ආපදවන් අවම කිරීමට අදළ ප්‍රදේශවල සැවොම කටයුතු කිරීමෙන් වඩාත් හිතකර තත්ත්වයක් ගොඩනැගිය හැකි අතර එයට සමස්ත ජනතාවගේ සහාය හා අනුග්‍රහය ලබාදීමෙන් සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් බිහිවීම නො අනුමාන ය.

**ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම**

**හිටපු අධි පර්යේෂක**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

## ගොවි ජනතා

**"ගොවි ජනතා"** සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සළකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**

**"ගොවි ජනතා"**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**

**114, විජේරාම මාවත,**

**කොළඹ - 07.**

**94-11-2696981, 2696437, 2698539 - 41**